ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025 - 08 . 20

ඩී.කේ.පී.වී. වීරසිංහ මයා
අංක 59/2,
ඇහැලේපොල කුමාරිහාමි මාවත,
මහනුවර.

**පැමිණිලිකාර පාර්ශවය.**

එස්.එස්. සේනාධීර මිය
විදුහල්පතිනිය,
මහ/මහමායා බාලිකා විදුහල,
මහනුවර.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය : HRC/KND/746/24 - M</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය විසින් 2024.12.26 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ 2025 වර්ෂයේ තම දරුවා මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියට ඇතුලත් කිරීමට අදාළව අයදුම්පතක් යොමු කරන ලද බවත්, ඒ අනුව 2024.09.18 වන දින සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ බවත්, එකී සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 75ක් හිමි වූ බවත්, එහෙත් තම දරුවාගේ නම තාවකාලික නාම ලේඛනයේ ඇතුළත් නොවූ බැවින් ලබා දී ඇති ලකුණු පිළිබඳව අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කළ බවත්, එකී අභියාචනය අංක AP 12 යටතේ 2024.11.29 වන දින විභාග කළ බවත් ය.

එසේම, 2024.11.29 දින පැවැත්වුණු අභියාචනා හා විරෝධතා කමිටුවේ ස්වාධීනතාවය හා විනිවිධතාවයට හානියක් වන අයුරින් මහමායා විද්‍යාලයේ විදුහල්පති හා ළමුන් බඳවා ගැනීමේ කමිටුවේ ලේකම් යන අයවලුන් අභියාචනා මණ්ඩලය පිහිටි පරිශ්‍රයට ඇතුළු වී අභියාචනා මණ්ඩලයට බලපෑම් සිදු කළ බවත්, පැමිණිලිකරු විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද R-152, R-153, R-22 හා R-58 දරණ අංක යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ ළමුන් පිළිබඳ විරෝධතාවයන් නොසලකා හැරුණු බවත්, 2025 වර්ෂයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමට අදාළව චක්‍රලේඛණයේ සඳහන්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

විධිවිධාන ප්‍රකාරව මහනුවර මහමායා විද්‍යාලය කටයුතු නොකිරීම හේතුවෙන් තම දරුවා හට පාසලට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අහිමිවී ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේහෙයින් මේ පිළිබඳව විමසා බලා සාධාරණයක් ඉටු කර දෙන ලෙස පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර මහ/ මහමායා විදුහලේ විදුහල්පතිනිය විසින් 2025.01.08 දිනැති වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරමින් කියා සිටින්නේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු 2024.09.14 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වූ අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පදිංචිය සනාථ කිරීමේ ප්‍රධාන ලේඛනය සඳහා (නාගරික කොමසාරිස් විසින් පදිංචිය සනාථ කිරීම සඳහා නිකුත් කරන ලද ලිපිය) ලකුණු 05ක් ද, පදිංචිය සනාථ කිරීමේ අතිරේක ලේඛන සඳහා සම්පූර්ණ ලකුණු 05ක් ද, ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා සම්පූර්ණ ලකුණු 25ක් ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සඳහා ලකුණු 40ක් ද ලබා දී ඇති අතර සමස්ත ලකුණු වශයෙන් ලකුණු 75ක් හිමි කර ගෙන ඇති බවත්, 2024.09.14 වන දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය සඳහා අඩුපාඩු සහිත ලිපිලේඛන ඉදිරිපත් කළ බැවින් 2024.09.18 වන දින නැවත කැඳවා ඔහු ඉදිරිපිට ලකුණු ලබා දීම සිදු කළ අතර ලකුණු පත්‍රිකාවේ සටහන් යොදා ඔහුට ලබා දුන් බවත් ය.

පැමිණිලිකරුගේ අභියාචනා හා විරෝධතා පිළිබඳව එකම අවස්ථාවේ විභාග කළ බවත්, ඒ අනුව 25/2024 චක්‍රලේඛයේ 7.2.1.1. වගන්තියේ සඳහන් වී ඇති පරිදි නාගරික කොමසාරිස්ගේ ලිපියට ලබාදිය යුතු උපරිම ලකුණු 05 පැමිණිලිකරු හට ලබා දී ඇති බැවින් ඒ පිළිබඳව නැවත සංශෝධනයක් සිදු නොකළ බවත්, පැමිණිලිකරු විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද R-153 ඉල්ලුම්කරුව 25/2024 චක්‍රලේඛණයේ 11.6 වගන්තිය අනුව වෙනම කැඳවීමක් කර පරීක්ෂා සිදු කර ඇති බවත් වගඋත්තරකාරිය සිය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, R-22 හා R-58 යන අයදුම්කරුවන්ගේ නම් නිවුන් දරුවන් ලෙස සඳහන් වීම පිළිබඳව පැමිණිලිකරු විසින් විරෝධතාවයක් දැක්වූ අතර එම අය පවුල් දෙකකට අයත් වන දරුවන් බැවින් එම අයගේ නම් ඉන් පසු ප්‍රසිද්ධ කර ඇති ස්ථිර නාමලේඛනයේ හරි ආකාරව සඳහන් කර ඇති බවත්, 25/2024 චක්‍රලේඛනය අනුව කටයුතු කර පාසලට පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුලත් කිරීම සිදුකළ බවත් වගඋත්තරකාරිය විසින් වැඩිදුරටත් දන්වා ඇත.

**<u>නිරීක්ෂණ</u>**

පැමිණිලිකරු තම දරුවා වන ඩී.එස්.ඒ. වීරසිංහ යන අයව 2025 වර්ෂයේදී මහ/මහමායා බාලිකා විද්‍යාලයේ පළමු වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් කර කැඳවුම් අංක RS-151 යටතේ 2024.09.14 වන දින සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 75ක් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2025 වර්ෂයේදී මහ/ මහමායා බාලිකා විද්‍යාලයේ පළමු වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ කඩයිම් ලකුණු ප්‍රමාණය වී ඇත්තේ ලකුණු 75 බවත්, ලකුණු 75ක් ලබාගත් අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිට ඇති බවත්, ඒ අතරින් එකී අයදුම්කරුවන්ගේ පදිංචි ස්ථානවල සිට පාසලට ඇති දුර ප්‍රමාණය අනුව පාසලට වඩාත් ආසන්න අයදුම්කරුවන් දෙදෙනෙකු තේරී පත්ව ඇති බවත්, පැමිණිලිකරුගේ දරුවා පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ සිටින බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පැමිණිල්ලේ සඳහන් කර ඇති පරිදි තාවකාලික ලකුණු ලැයිස්තුවේ R-22 හා R-58 යන අයදුම්කරුවන් දෙදෙනාගේ දරුවන්ගේ නම් නිවුන් දරුවන් ලෙස සඳහන් වී තිබී ඇති නමුත්, ස්ථිර ලේඛනයේ ඔවුන් එලෙස නිවුන් දරුවන් ලෙස සඳහන් නොවන බව පෙනී යයි. කෙසේවෙතත් එලෙස තාවකාලික නාම ලේඛනයේ R-22 හා R-58 යන අයදුම්කරුවන් දෙදෙනාගේ නම් නිවුන් දරුවන් ලෙස සඳහන් වී තිබීම තුළින් පැමිණිලිකරුට  අගතියක් සිදු වී නොමැති බව ද කොමිෂන් සභාවට පෙනී යයි.

පැමිණිලිකරු විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද R-152 හා  R-153 යන අයදුම්කරුවන් පිළිබඳව අභියාචනා විරෝධතා කමිටුව විසින් 25/2024 චක්‍රලේඛනයේ 11.6 වගන්තියට අනුව පරීක්ෂණයන් සිදු කර ඇති බවත්, එම පරීක්ෂණය අනුව R-153 අයදුම්කරු එම නිවසේ පදිංචිව සිටින බව නැවත වරක් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී තහවුරු වී ඇති බවත් වගඋත්තරකාර මහ/ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් සඳහන් කර ඇත.

R-152 සහ R-153 යන අයදුම්කරුවන් දෙදෙනා එකම පවුලේ සහෝදරයෙකු සහ සහෝදරියක වන බවත්, ඔවුන් දෙදෙනා විසින්  පදිංචිය සනාථ කිරීම සඳහා නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද එම අයදුම්කරුවන්ගේ පියාගේ නමින් ඇති වාර්ෂික බදු බලපත්‍රයක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා ලකුණු 16 බැගින් ඔවුන් දෙදෙනා වෙත ලැබී ඇති බවත් නිරීක්ෂණය වේ.

2025.01.29 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී වගඋත්තරකාර මහ/ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් සඳහන් කර ඇත්තේ R-152 සහ R-153 යන අයදුම්කරුවන් දෙදෙනා තේරී පත් වී ඇත්තේ ඔවුන්ගේ පියාගේ නමින් ඇති ඔප්පුවක් මගින් බවයි.

25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1 අනුව පදංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන ලෙස පහත ලේඛන පිළිගැනෙන බව දක්වා ඇත.

"✓ සින්නක්කර ඔප්පු

✓ බිම්සවි සහතික

✓ තෑගි ඔප්පු

✓ දීමනා පත්‍ර

✓ රජයේ ප්‍රධාන (හිමිකරු මියගොස් ඇත්නම් අයදුම්කරු/කලත්‍රයා අනුප්‍රාප්තිකයෙකු ලෙස නම් කර තිබි යුතු අතර, අදාළ බලධාරියා විසින් ඒ බව සනාථ කළ යුතු ය.)

✓ විහාර හා දේවාල ගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික

✓ පත් ඉරු මගින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු

✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන, සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර ඇති නමුත්, මෙතෙක් අදාළ ආයතන මඟින් එහි හිමිකරු වෙත එම දේපල පවරා නොමැති නිවාස (සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කරන ලද බවට අදාළ ආයතනයෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතු ය.)

(සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබි යුතු ය. එසේ නොමැති නම් ප්‍රකාශන ඔප්පුව ලියාපදිංචි කර ඇති දිනට වසර 10 කට වැඩි කාලයක් පදිංචිව සිටි බවට ලේඛන මඟින් තහවුරු කළ යුතු ය.)

I. පදිංචි ස්ථානයේ හිමිකම ඔප්පු කිරීමට ඉදිරිපත් කරනු ලබන ඉහත ලේඛන ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ නමට ඇත්නම් -ලකුණු 20

II. ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට හිමිකම ඇත්නම් -ලකුණු 16"

25/2024 චක්‍රලේඛනයේ ඉහත සඳහන් ප්‍රතිපාදනය ප්‍රකාරව ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට අදාළ හිමිකම ඇත්නම් ලකුණු 16ක් ලබා දිය හැකි බවට සඳහන් වන බවත්, ඒ අනුව ඉහත කී R-152 සහ R-153 යන අයදුම්කරුවන් දෙදෙනා හට ඔවුන්ගේ පියාගේ නමින් ඇති බදු බලපත්‍රය, ඔප්පුවක් ලෙස සලකා ඒ සඳහා වගඋත්තරකාර මහ/ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් ලකුණු 16 බැගින් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

එහෙත් R-152 සහ R-153 යන අයදුම්කරුවන් දෙදෙනා විසින් ඉදිරිපත් කර ඇති ඔවුන්ගේ පියාගේ නමින් ඇති බදු බලපත්‍රය ඉහත කී 25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1 අනුව පදංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන ලෙස සඳහන් ලේඛනයන්ට අයත් ලේඛනයක් නොවේ. ඒ අනුව එකී ලේඛනය සඳහා එලෙස ලකුණු 16ක ප්‍රමාණයක් ලබාදීමේ හැකියාවක් නොමැත.

2025.07.09 වන දින කොමිෂන් සභාව විසින් මහනුවර මහ නගර සභාවේ ඉඩම් අංශයෙන් සිදු කළ විමසීමේ දී එහි නිලධාරිණියක විසින් සඳහන් කරන ලද්දේ ඉහත කී R-152 සහ R-153 යන අයදුම්කරුවන් දෙදෙනා විසින් ඉදිරිපත් කර ඇති ඔවුන්ගේ පියාගේ නමින් ඇති වාර්ෂික බදු බලපත්‍රය සැලකිය හැකි වන්නේ බදු ගිවිසුමක් ලෙස බවත්, ඉදිරියේ දී වසර තිහක කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹීමට නියමිතව ඇති බවත් ය.

25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1. වගන්තිය අනුව අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ නමින් පමණක් ඇති අඛණ්ඩව ලියාපදිංචි කළ බදු ඔප්පුව සඳහා පමණක් ලකුණු 10ක් ලබා දිය හැකි බව දක්වා ඇත. එසේහෙයින් R-152 හා R-153 අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාර්ෂික බදු බලපත්‍රය, එකී අයදුම්කරුවන්ගේ හෝ කලත්‍රයන්ගේ නමින් නොව අයදුම්කරුවන්ගේ පියාගේ නමින් ඇති බැවින් ඒ සඳහා එම අයදුම්කරුවන් වෙත කිසිදු ලකුණක් ලබා දිය නොහැකි බව නිරීක්ෂණය වේ.

තවද, 25/2024 චක්‍රලේඛනයේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් යන ගණය යටතේ ලකුණු ලබාදීමේ දී 7.2.1.1. වගන්තිය අනුව පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ ලකුණු උපයා ගන්නා අයදුම්කරුවන්ට පමණක් ඉන් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු බව සඳහන් කර ඇත. එසේහෙයින් ඉහත කී R-152 හා R-153 අයදුම්කරුවන් විසින් පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ ඉදිරිපත් කර ඇති පියාගේ නමින් ඇති නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රය සඳහා කිසිදු ලකුණක් හිමි නොවන බැවින් ඉන් ඉදිරියට කිසිදු ලකුණක් හිමි නොවන බව ද පෙනී යයි. ඒ අනුව R-152 අයදුම්කරු වෙත ලකුණු 75.2ක් සහ R-153 අයදුම්කරු වෙත ලකුණු 76ක් ලබාදීමත් නිවැරදි නොවන බවත්, ඒ තුළින් 25/2024 චක්‍ර ලේඛනයේ අන්තර්ගත ප්‍රතිපාදන උල්ලංඝණය කිරීමක් වගඋත්තරකාර පාර්ශවය විසින් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, කොමිෂන් සභාව හමුවේ 2025.01.29 දින පැවති පරීක්ෂණයේ දී පැමිණිලිකරු පවසා සිටියේ පදිංචිය සනාථ කිරීම සඳහා නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද ලිපියට ඔහුට ලකුණු 05ක් පමණක් ලබා දී ඇති නමුත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ලිපි වලට R-11, R-12, R-13 හා R-14 වන අයදුම්කරුවන්ට ලකුණු 20ක් ලබා දී ඇති බවයි.

එසේවුවද, වගඋත්තරකාර මහ/ මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කර බැලීමේ දී R-11, R-12 සහ R-13 යන අයදුම්කරුවන්

හට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ලිපි හා ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද පදිංචිය සනාථ කිරීමේ ලිපි සඳහා ලකුණු 16ක් බැගින් ලබා දී ඇත්තේ එකී දේපළ වල අයිතිය අයදුම්කරුවන්ගේ දෙමව්පියන් වෙත හිමි වන බවට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තහවුරු කිරිම මත බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත්, 25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1 අනුව පදංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන එවැනි ලිපි සඳහා ලකුණු ලබා දිය හැකි බවට සඳහන් නොවේ.

එසේ හෙයින් R-11, R-12 සහ R-13 යන අයදුම්කරුවන් විසින් ඔවුන් අදාළ ලිපිනයේ වසර 10කට වැඩි කාලයක් පදිංචිව සිටින බවට අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික සඳහා 25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1 හි "අයදුම්කරු/කලත්‍රයා අඛණ්ඩව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික" යටතේ ලකුණු 05ක් ලබා දිය හැකි බවත්, ඒ අනුව පදංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ලිපි සඳහා ලබා දී ඇති ලකුණු 16 වෙනුවට ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික සඳහා ලකුණු 05ක් ලබා දිය යුතු වන බැවින් R-11, R-12 සහ R-13 යන අයදුම්කරුවන් හට මේ වන විට ලැබී ඇති මුළු ලකුණු 91ක ප්‍රමාණය ලකුණු 80ක් ලෙස සංශෝධනය විය යුතු බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. කෙසේවෙතත් එකී අයදුම්කරුවන්ගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 80 ක් ලෙස සංශෝධනය වූ විට ද කඩඉම් ලකුණු ප්‍රමාණය වන ලකුණු 75ක ප්‍රමාණය ඉක්මවා යන බැවින් එම අයදුම්කරුවන්ගේ දරුවන් 2025 වර්ෂයේ මහ/ මහමායා බාලිකා විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කරගැනීම තුළින් ගැටලුවක් මතු නොවන බව පෙනී යයි.

තවද, R-14 යන අයදුම්කරු විසින් පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්.එස්. දිසානායක මහතා විසින් ලියා සහතික කළ අංක 1457 සහ 2016.04.29 දිනැති විකුණුම්කරය සඳහා ලකුණු 20ක් ලබා දී ඇත බවත් නිරීක්ෂණය වන බැවින් එම අයදුම්කරු වෙත ලබා දී ඇති ලකුණු සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති බවක් නිරීක්ෂණය නොවේ.

තවද, ඉහත කී ලෙස 25/2024 චක්‍රලේඛනයේ 7.2.1.1. වගන්තිය අනුව අයදුම්කරු / කලත්‍රයා අඛණ්ඩව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික සඳහා ලකුණු 05ක් හිමිවන බව සඳහන් කර ඇත. පැමිණිලිකරු වෙත මහනුවර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් නිකුත් කර ඇති අංක CPC/KMC/LDP/LC6 සහ 2024.07.04 දිනැති ලිපිය ප්‍රකාරව පැමිණිලිකරු පදිංචි මහනුවර මහ නගර සභාවට අයත් නාගරික ඉඩම ඉදිරියේ දී නියමානුකූල කිරීමට නියමිත බවට දක්වා ඇත. අඛණ්ඩව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක පදිංචිව සිටීම තුළින් දිගුකාලීනව අදාළ දේපළ භුක්ති විඳ ඇති බවට තහවුරු වන අතර, එවැනි ඉඩම් නියමානුකූල

කිරීමේ දී එලෙස අඛණ්ඩව පදිංචිව සිටි අය වෙත එකී ඉඩම හිමිවීමේ වැඩි ඉඩක් පවතියි. එසේහෙයින් එවැනි සහතික සඳහා ලකුණු 05ක් පමණක් ලබා දීම ප්‍රමාණවත් නොවන බවත්, 25/2024 චක්‍රලේඛනයේ සඳහන් එකී ලකුණු ප්‍රමාණය සංශෝධනය විය යුතු බවත් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

## නිගමනය

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරගැනීමට අදාළ 25/2024 චක්‍රලේඛනයේ අන්තර්ගත විධිවිධාන ප්‍රකාරව R-152 හා R-153 අයදුම්කරුවන් විසින් පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ ඉදිරිපත් කර ඇති එකී අයදුම්කරුවන්ගේ පියාගේ නමින් ඇති නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රය සඳහා කිසිදු ලකුණක් හිමි නොවන බැවින් ඉන් ඉදිරියට කිසිදු ලකුණක් ද ලබාදිය නොහැකි තත්ත්වයක් තුළ R-152 අයදුම්කරු වෙත ලකුණු 75.2ක් සහ R-153 අයදුම්කරු වෙත ලකුණු 76ක් ලබාදී එම අයදුම්කරුවන්ගේ දරුවන් දෙදෙනා 2025 වර්ෂයේ මහ/ මහමායා බාලිකා විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කරගැනීම තුළින්, 'පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්' යන ගණය යටතේ කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 75ක ප්‍රමාණය ලබාගනිමින් පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ සිටින පැමිණිලිකරු හට තම දරුවා ඇතුළත් කරගැනීමට අවකාශය අහිමි වී ඇති බව තහවුරු වේ.

එසේහෙයින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම ද සෑම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. පැමිණිලිකරුගේ දරුවා වන ඩී.එස්.ඒ. වීරසිංහ යන අය 2025 වර්ෂයේ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතු ය.

2. වගඋත්තරකාර පාර්ශවය මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025.09.24 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකාරිය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා